Article 12(1) / 12(2)

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு

**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2019 - 10 - 30 |

පැමිණිලි පාර්ශවය :- කේ.කුසුමාවතී මිය,
දේවාලගොඩ,
ලාහුගල.

වගඋත්තර පාර්ශවය :- 01. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ.

02. අධ්‍යක්ෂ,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත, කොළඹ 10.

පැමිණිලි අංකය :- **HRC/AM/105/17**

උක්ත පැමිණිලිකාර කේ. කුසුමාවති යන අය විසින් 2017/08/30 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තම ස්වාමි පුරුෂයා වන ඩී.ආරියපාල දේවසුරේන්ද්‍ර යන අය පොතුවිල් පොලිස් ස්ථානයේ කම්කරුවෙකු ලෙස සේවය කරමින් සිටියදී ත්‍රස්තවාදීන් විසින් පැහැරගෙන ගොස් 1990/06/11 වන දින ඔහු මරාදමන ලද බවයි.

ඉන්පසු පොලිස් දෙපාර්තමේන්තුව මඟින් මාසිකව 2015 මාර්තු මාසය දක්වා වැටුප් ලබාදුන් බවත්, පවුලේ දරුවන් ජීවත් කරවූයේද එම මුදලින් බවත්, ඇයට කිසිදු වෙනත් ආදායමක් නොමැති බවත් නමුත් 2015 වර්ෂයෙන් පසු එම මුදල් ලබා නොදීම හේතුවෙන් තමන් අගතියට පත්ව ඇති බවත් පැමිණිල්ලෙන් සඳහන් කර ඇත.


| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති / தவிசாளர் / Chairperson | 011-2505451 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2505541 / 74 |
| දුරකථන / தொலைபேசி / Telephone | 94-11-2505580 / 81 / 82 | ලේකම් / செயலாளர் / Secretary | 011-2505521 | ක්ෂණික / துரித அழைப்பு / Hotline | 1996 |
| ඊමේල් / மின்னஞ்சல் / E-mail | sechrc@gmail.com | වෙබ් / இணையம் / Web | www.hrcsl.lk | | |

තමා වෙත මාසික වැටුපක් නොගෙවන්නේ නම් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හෝ ගෙවීමට කටයුතු කරන ලෙස පොලිස් සුභසාධක මධ්‍යස්ථානය ,කොළඹ මගින් අම්පාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වෙත 2015/06/04 වන දිනැති ලිපිය මගින් දන්වා ඇති බවත්, ඉන්පසුව සියළු ලියකියවිලි ඉදිරිපත් කළ නමුත් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින්, අවසන් වරට සේවය කරන ලද ආයතන ප්‍රධානියාගෙන් විමසන ලෙස 2016/12/20 හා 2017/04/20 වන දිනැති ලිපි මගින් දන්වන ලද බවත් සඳහන් කර ඇත.

ඒ පිළිබඳව නැවත විමසීමේදී 3/2014 චක්‍රලේඛය අනුව 2014/12/31 දිනට පෙර විශ්‍රාම වැටුප් සඳහා මනාපය පළකල යුතු බව දැනුම්දී ඇතත් එම චක්‍රලේඛය ආයතන ප්‍රධානීන්ට පමණක් යොමු කර තිබීම හේතුවෙන් අදාළ ආයතන විසින් පැමිණිලිකාරිය දැනුවත් කිරීමක් සිදුනොකළ බවත්, එම කාරණය සම්බන්ධයෙන් දැනුවත් නොවීම මත මනාපය පළකර යැවීමට නොහැකි වූ බවත් සඳහන් කර ඇත. 3/2014 චක්‍රලේඛය පිළිබඳව නොදැනුවත්වීම නිදහසට කරුණක් නොවන බව තමා වෙත දන්වා ඇති බවද පැමිණිලිකාරිය විසින් ප්‍රකාශ කොට ඇත.

වගඋත්තර පාර්ශවය විසින් මෙවැනි කාරණා ඉදිරිපත් කිරීම තුලින් ඇය හට ජීවත්වීමට තිබූ අයිතිය අහිමිකර, ත්‍රස්ත ක්‍රියා හේතුවෙන් මියගිය ඔහුගේ ස්වාමියා හට හිමි කිසිදු මුදලක් නොලැබී අසරණ භාවයට පත්ව සිටින බව වැඩිදුරටත් මෙම පැමිණිල්ල මගින් සඳහන් කර ඇත.

වගඋත්තර පාර්ශවයේ සැලකිරීම :-

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට සහකාර අධ්‍යක්ෂ විසින් යොමු කර ඇති 2017/10/27 දිනැති ලිපියෙන් දන්වා ඇත්තේ, 2010 අංක 08 දරණ වැන්දඹු අනත්දරු අරමුදලේ සංශෝධිත පනත හා 2010 අංක 09 දරණ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත සංශෝධනයෙන් 2010 අගෝස්තු 17 වනදින සිට ක්‍රියාත්මක බවත්, ඊට අදාළව 2010/12/16 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 13/2016 නිකුත් කර ඇති බවත්, ඊට අදාලව 2010/12/16 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 13/2010 නිකුත් කර ඇති බවත්ය. ඒ අනුව සංශෝධිත පනතේ විධිවිධාන වලට අනුව 2010 අගෝස්තු මස 17 වන දින සිට ක්‍රියාත්මක බවත්, ඊට අදාළව 2010/12/16 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 13/2016, විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 13/2010 නිකුත් කර ඇති බවත් සඳහන් කර ඇත.

ඒ අනුව සංශෝධිත පනතේ විධිවිධානවලට අනුව 2010 අගෝස්තු මස 17 වන දිනට පෙර ත්‍රස්තවාදී ක්‍රියා හේතු නිසා සහ ස්වාභාවික ආපදා මත මිය යන හිමිකම් ඇති රාජ්‍ය නිලධාරින් වෙනුවෙන් අවසන් වරට ගෙවන වැටුප පදනම් කොට ගෙන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප සංශෝධනය කිරීම සම්බන්ධයෙන් හිමිකම් පෑමේ දිනය විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2014 ලෙස 2014/12/31 තෙක් දිර්ඝ කර ඇති බවත්, ඒ

අනුව කරනු ලබන ඉල්ලීම් සම්බන්ධව කටයුතු කිරීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් හට බලයක් නොමැති බවත්, ඒ සඳහා රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතු බවත්, මෙම පැමිණිලිකාරිගේ ඉල්ලීම සම්බන්ධයෙන් හිමිකම් පෑමේ දිනය දීර්ඝ කිරීම සඳහා රජය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගනු ලැබුවහොත් පැමිණිලිකාරිය විසින් ඉල්ලීමක් ඉදිරිපත් කළ පසුව වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳව සලකා බැලිය හැකි බවත් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් දන්වා ඇත.

වගඋත්තර පාර්ශවීය පොලිස්පති, පොලිස් මූලස්ථානය, කොළඹ වෙතින්ද මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් වාර්තා කැඳවා ඇත. එම වාර්තාවේ සඳහන් වන්නේ, කේ. කුසුමාවති මියගේ පැමිණිල්ලට අදාළව අධ්‍යක්ෂ/සිවිල් පරිපාලන වෙතින් වාර්තාවක් කැඳවන ලද බවයි. එම වාර්තාවේ සඳහන් කරුණු ලෙස "පැමිණිලිකාරියගේ ස්වාමිපුරුෂයා වන දේවසුරේන්ද්‍ර ආරියපාල යන අය පොතුවිල් පොලිස් ස්ථානයේ අනියම් කම්කරුවකු ලෙස 1990.01.01 සිට 1990.06.10 දින දක්වා සේවය කර ඇති බවත්, එම කාලයට අදාළව දෛනික වැටුප ලබාගෙන ඇති බවත්, ඔහු මිය යාමෙන් පසුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/88 ප්‍රකාරව 1990.06.11 වන දින සිට ඔහුගේ බිරිඳ වෙත මාසික වැටුප ගෙවා ඇති බවත්, 2015 මාර්තු මාසයෙන් පසුව මියගිය දේවසුරේන්ද්‍ර ආරියපාල යන අයගේ වයස අවු :55 සම්පූර්ණ වීම හේතුවෙන් වැටුප් ගෙවීම නතර කළ බවත්, මොහුගේ වැටුපෙන් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් අයකර ගෙන නොමැති බවත්, පැමිණිලිකාරිය විසින් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට ඇතුළත් වීම සඳහා කිසිදු ලේඛනයක් ඉදිරිපත් කර නොමැති බවත්, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අම්පාර විසින් යොමු කරන ලද වාර්තාවේ සඳහන් කර ඇත.

පසුව 2015/04/23 වන දින මියගිය තම ස්වාමිපුරුෂයා වෙනුවෙන් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප ලබාගැනීම සඳහා ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කර ඇති බවත්, ඒ අනුව මියගිය පුද්ගලයාගේ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි කරන සාමාන්‍ය ක්‍රමයට ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය ලිපිලේඛන ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අම්පාර වෙතින් තොරතුරු ලබාගෙන අධ්‍යක්ෂ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් කාර්යාලය වෙත 2016.05.25 වන දින යොමු කර ඇති බවත් සඳහන් වේ. පැමිණිලිකාරියගේ ස්වාමියා ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මිය ගිය අයෙකු වන බැවින් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2014 ට අනුව අදාළ වැන්දඹුවගේ ඉල්ලීම 2014.12.31 දිනට පෙර ආයතනය වෙත ඉදිරිපත් කළ බවට ආයතනික තහවුරුවීමක් හෝ අනියම් පත්වීම් ලිපිය සමඟ තොරතුරු ඉදිරිපත් කළ යුතු බවට විශ්‍රාම වැටුප් කාර්යාලය විසින් දන්වා තිබීම මත ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අම්පාර වෙතින් වාර්තාවක් කැඳවූ බවත්, එහිදී 2015.04.23 වන දින ඇය විසින් ඉල්ලීම් ලිපිය යොමු කර ඇති බවට හා සේවක මහතාගේ යැපෙන්නන්ගේ නොදැනුවත්භාවය හේතුවෙන් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප ඉල්ලීම ප්‍රමාදවීම සිදුව ඇති බව අධ්‍යක්ෂ පොලිස් මූලස්ථානය වෙතින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ලිපියක් මඟින් දන්වා ඇත. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් එම අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප කර ඇත.

විමර්ශණයේදී අනාවරණය වී ඇති කරුණු :-

පැමිණිලිකාරියගේ ස්වාමියා රාජකාරි කරමින් සිටින අවස්ථාවකදී ත්‍රස්තවාදී ප්‍රහාරයකින් ජීවිතක්ෂයට පත් වී ඇති අතර, පැමිණිලිකාරියගේ ස්වාමියා මිය ගිය පසු ඇයට හිමි වැටුප් ලබාදීම සිදුකර ඇතත්, මියගිය අයගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වූ පසු වැටුප් ලබාදීම නතර කිරීම නිසා මෙම පැමිණිලිකාරිය අසරණභාවයට පත්වී ඇති බව අනාවරණය වේ.

පැමිණිලිකාරිය රජයේ නීතිරීති පිළිබඳ කිසිදු දැනීමක් නොමැතිව සිටින බවත්, වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ලබාදීම සඳහා ඉල්ලීම් කරන ලෙස රජයේ නිලධාරීන් විසින් ඇයව දැනුවත් කිරීමක් කර නොමැති බවත් නිරීක්ෂණය වේ.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිකුත් කර ඇති වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් පිළිබඳ සියලුම චක්‍රලේඛ නිකුත් කර ඇත්තේ සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ප්‍රාදේශීය ලේකම්වරුන් සඳහා පමණක් වන අතර, පැමිණිලිකරුවන්ට ඒ පිළිබඳව කිසිවක් දැනුම් දී නොමැත.

විශේෂයෙන්ම අදාළ චක්‍රලේඛ ලාහුගල ප්‍රාදේශීය ලේකම් හා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි, අම්පාර වෙතද ලැබී ඇති අතර, ඒ පිළිබඳව පැමිණිලිකාරිය දැනුවත් නොකිරීම නිසා පැමිණිලි පාර්ශවයට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට මනාපය පළ කිරීමට තිබූ අවස්ථාව අහිමි වී ඇති බව අනාවරණය වේ.

ඉහත කරුණු වලට අනුව වගඋත්තර පාර්ශවයන්ගේ ක්‍රියාකලාපය හේතුවෙන් පැමිණිලිකාරියට හිමි වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අහිමි වී ඇති අතර, පැමිණිල්ලේ සඳහන් කරුණු හා විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු අනුව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1), 12(2) ව්‍යවස්ථා මගින් සහතික කර ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව මෙම පරීක්ෂණයෙන් අනතුරු නිගමනය කරනු ලැබේ.

නිර්දේශ :-

ඒ අනුව වගඋත්තර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් පැමිණිලිකාරියට හිමි වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමට අවශ්‍ය පියවර ගත යුතුය.

2019. 11.29 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

B/